


# මාධවී හා මෙලී

- කතෘවරිය හා චිත්‍ර නිර්මාරණය -

විද්‍යා ලෙවන්ගම

# පිදුම

ගත් කතුවරියක් ලෙස

ලොව දකින්නට

මා හට මගපෙන්වූ

මහමායා බාලිකා විදුමවිනි

ඔබට මම මෙම පොත

ආදරයෙන් පුදමි....



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහු විධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධිර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත,

සම්මානිත මහාචාර්ය,

පේරාදෙණිය විශ්ව විද්‍යාලය,

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල් වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ඔන්න එකමත් එක රටක් තියෙනවා. ඒ රටේ මධවී කියලා ලස්සන ගැණු ළමයෙක් ඉන්නවා. එයා හරිම හොදයි. එයා කම්මැළිත් නෑ. හරිම කඩිසරයි. අනිත් අයට උදව් කරනවා. හැම තිස්සෙම හිනා වෙලා ඉන්නේ. ගමේ හැමෝම එයාට ආදරෙයි. කවදාවත් අනිත් කට්ටියට නරකක් වෙන්න ඉඩ තියන්නෑ.




ඉතින් මම අද කියන්න යන්නේ ලස්සන කතාවක්.

මාධවී පොඩි කළේ එයා ගාව ලස්සන පූසෙක් හිටියා . එත් එයා වළකට වැටිලා මැරුණා. ඉතිං එයාට ගොඩක් දුකයි. ඒත් එයා හිනාවෙලා තමයි ඉන්නේ.

ඉතින් දැන් මාධවීට යාළුවෝ ගොඩක් ඉන්නවා. මාධවීට වයස 12යි. ඒ කියන්නේ එයා 7 වසරේ ඉන්නේ. එයාගේ පාසල තමයි "ක්ලෝරි ටවර්ස්" ඒක ලස්සන ඉස්කෝලයක්. එයා ගෙදර එන්නේ යාළුවෝ එක්ක ඉතින් යාළුවෝ එක්ක එද්දි හොදටම වැස්සා.



ඉතිං මාධවීයි එයාගේ යාළුවොයි ගහක් ළඟට ගියා. වැස්සෙන් ආරක්ෂා වෙන්න ඉතින් එයාලගේ යාළුවෝගෙ ගෙදරවල් තියෙන්නේ ළඟ ඉතින් ඒ ගොල්ලෝ ගෙදරවල් වලට දුවගෙන ගියා. ක්ලාසා කියන යාළුවයි මාධවීයි හිටියේ. ඉතින් හොඳටම වැස්ස මාධවී ට සද්දයක් ඇහුණා. එයාලට ක්ලාසටත් මාධවීටත් දෙන්නාට ඇහුණා. එයාලට ඒ සද්දේ ඇහුණේ පදුර අස්සෙන්

"මාධවී ඔය බදුර චුට්ටක් හොයලා බලන්න" ක්ලාසා බයෙන් කිව්වා.

"මට බයයි... අපි දෙන්නාම බලමු" මාධවී කිව්වා.

ඉතින් ඒ දෙන්නම බැලුවා බලද්දි ලස්සන පුසෙක් ඉන්නවා.



"ක්ලාසා මෙයා ලස්සනයි. මම මෙයාව ගෙදර ගෙනියනවා" මාධවී සතුටු වෙලා කිව්වා.

"ඔව් මෙයා ලස්සනයි හැබැයි මට මෙයාව ගෙනියන්න දෙන්න බෑ.... මොකද අපේ ගෙදර පූසෝ දෙන්නෙක් ඉන්නවා" ක්ලාසා කිව්වා.

"එකනේ... අපේ ගෙදර හුරතලෙක් නෑ මම මෙයාව ගෙනියනවා අම්මා කැමති වෙයි. වැස්ස පැව්වා දැන් යමු" මාධවී කිව්වා.

"Bye...... හම්බෙමු පුස් පැටියව බලා ගන්න සති දෙකයිනේ......... Bye......" ක්ලාසා කිව්වා.

"Bye......" මාධවී කිව්වා.

මාධවීත් ගෙදර ගියා....



අම්මා මාධවී එනකක් තමයි ගෙදර බලාගෙන හිටියේ

"දුව මම හොඳටම බයවුණා...... මේ වැස්සේ දුව එනකන්......... මට කුඩයක් යවන්න බැරි වුණානේ" අම්මා දුකෙන් කිව්වා.

"ඒකට කමක් නෑ.... එක හින්දා තමයි මට හම්බුණේ" මාධවී සතුටෙන් කිව්වා.

"මොනවාද හම්බුණේ" අම්මා ඇහුවා.

"මම පුස් පැටියෙක් ගෙනවා" මාධවී කිව්වා.

විස්තර කියන ගමන් පුස් පැටියව පෙන්නුවා. අම්මා මුණ ඇඹුල් කළා......

"මම කැමති මෙයාට.... තාත්තා අපුවාම මොනවා හරි කරන්න. දැන් ඇග හෝදලා බත් කාලා, ගෙදර වැඩ කරන්න" අම්මා කිව්වා.

ඔළුව හොලවපු මාධවී ගෙදර වැඩ ඔක්කොම කළා, ඇගත් හේදුවා පුස් පැටියා බලාගෙන හිටියා. මාධවී කද්දි පුස් පැටියටයත් කෑම දැම්මා. පුස් පැටියාත් කෑම කෑවා.

මාධවී කල්පනා කළා පුස් පැටියට දානන හොද නමක් ඒ වෙලාවෙම තත්තා කාර් රථයකේ ආවා.

"චුටි දුව මොකද මෙතන, බර කල්පනාවක වාගේ" තාත්තා කිව්වා.

"තාත්තා ඔයා ආවද? අම්මේ... අම්මේ.... අම්මේ.. තාත්තා ආවා" මාධවී කිව්වා.

"ඉන්න..... එනවා..... ඔයා ආවාද? දුවය ප්‍රශ්ණයක් අහන්න ඕනලු" අම්මා කිව්වා.

"තාත්තේ මම පුස් පැටියෙක් ගෙනාවා එයා තියාගන්නද? ආ... කියපු ගමන් ආවා මම පුස් පැටියෙක් ගෙනවා" මාධවී කිව්වා.

පුස් පැටියා හම්බුණ වේලාවේ ඉදන් කිව්වා.



“ආ මේ පුංචි පැටියද? අම්මා කැමතිනම් තියා ගන්න.... දැන් මම මෙයාව ගෙනියනවා මොකද විසබීජ යනකන් මෙයාව හොදන්න” තාත්තා කිව්වා.

මාධවීට ඉහේ පිපුණ මලක් වගේ හරිම සතුටුයි. මාධවී ගෙදර හැම තැනම සතුටින් දිව්වා සතුට සමරලා පුංචි මාධවී කල්පනා කළා. පුස් පැටියට දාන්න. හොද නමක් එයා හිතුවා මෙලි, ජෙනි, බින්සි කියලා නම දාන්න. ඒ වෙලාවෙම මාධවීගේ තාත්තා පුස් පැටියාව ගෙනත් දුන්නා.

“හුරතල් පුස් පැටියෝ මම අද ඉදන් ඔයාට මෙලි කියනවා” පුසාව හුරතල් කරමින් මාධවී කිව්වා.

“මියාව්, මියාව්, මියාව්, මියාන් ” කියලා මෙලි සතුටෙන් කිව්වා.

දැන් මෙලිටයි, මාධවීටයි හරිම සතුටුයි

ඉතිං මාධවී මෙලිවත් අරන් සෙල්ලම් කරා ඉතික් හවස වුණා මාධවී මෙලිවත් අරන් සෙල්ලම් කළා. මාධවීගේ තාත්තා මෙලිය ගෙදරකුත් හදලා එක හරිම ලස්සනයි.




මෙලි සතුටින් ඒ ගේ ඇතුළට ගියා. එළිය හරිම කළුවරයි.

“දැන් චුටි ගෙදරට යමු” තාත්තා කිව්වා.

මාධවී ඔළුව වනලා මෙලිවත් අරන් ගේ ඇතුළට ගියා. දැන් කෑම කන වේලාව. මාධවී ගේ අම්මා මෙලිට ලී වලින් හදපු පිගානක් දීලා ඒකට කෑම දැම්මා. මෙලි ඒවා කෑවා මාධවීත් සතුටෙන් බත් කෑවා.

ඉතින් රෑ වුණා හින්දා මාධවී මෙලිව ගෙදරට දාලා නිදා ගත්තා.

ඊළඟ දවසේ උදේ පාන්දර මාධවීයි, මෙලීයි නැගිට්ටා මාධවී මුණ හෝදලා, ඇදුමක් දාලා, කෑම කෑවා. මෙලිත් අම්මා කෑම දැම්මාත මාධවී අම්මගෙන් ඇහුවා කැළෑවට ගිහින් සෙල්ලහ් කරන්නද කියලා.

"කැළෑවට යන්න එපා... කැළේ ළඟ ගිහිල්ලා සෙල්ලම් කරාට කමක් නෑ පරිස්සමින්" අම්මා කිව්වා.

"හරි අම්මේ මම යනවා" මාධවී කෑ ගහලා කිව්වා.

මාධවී අම්මා කියන දේ අහන්නේ නැතුව කැළේට ගියා සෙල්ලම් කරන්න.



එයාලා දන්නේ නැතුව දවල් වෙලා.

“මොලි බෝලේ අරහෙට ගියා.... අපි අරන් එමු.... එන්න මෙලි” මාධවී කිව්වා.

ඉතින් මෙලියි, මාධවීයි ගියා කැළේ ඇතුළට මාධවී දුවන් යද්දී ගලක් තිබිලා එයා බිම වැටුණා. මාධවීගේ කකුළ කැඩිලා වගේ....

“මලි... අනේ තාත්තාට එන්න කියන්න.... ආ..... ආ..... මට ගොඩක් රිදෙනවා අනේ ආයි......” මාධවී අඩ අඩා මොලිට කිව්වා.

මාධවී අඩන දිහා බලාගෙන හිටපු මොලි ඉක්මනට මාධවීගේ ගෙදර ගියා. තාත්තා පත්තරේ කියව කියව හිටියේ
මෙලි තාත්තාගේ කකුළ ගාවට ගිහින් මියාව්...
මියාව්.... මියාව්..... සිය පාරක් විතර කිව්වා. තාත්තාට අමුත්තක් දැණුනා.

“මෙලි.. මෙලි.. මොකද” තාත්තා අමුත්තක් දැනිලා මෙලි දිහා බලාගෙන හිටියා.

“මෙලි.. ඔයා ගියේ මාධවී එක්කනේ.... කෝ මාධවී ...... මාධවීට කරදරයක්ද? ඉන්න මම එනවා.....”

ඉතින් මෙලි යන පාරෙන් තාත්තා ආවා තාත්තා දැක්කා මාධවී වැටිලා ඉන්නවා.

“තාත්තේ රිදෙනවා කකුළ රිදෙනවා අනේ රිදෙනවා....” මාධවී අඬ අඬා කිව්වා.

ඉතින් තාත්තා ඉක්මනින් දුව ව අත් දෙකින් අරන් ළග තිබුණ ඉස්පිරිතාලෙට ගියා. තාත්තා ගෙදර ගිහින් අම්මට ඔක්කොම පැහැදිලි කළා. ඊට පස්සේ මාධවී හිටපු ඉස්පිරිතාලෙට අම්මයි, තාත්තායි ගිහිල්ලා බෙහෙත් අරන් මාධවී එක්ක ගෙදර ආවා.

දවස් හතරෙන් මාධවීගේ කකුළ හොද වුණා. මාධවීට කකුළ හරි ගියපු එකට හරිහ සතුටුයි. එයාගේ ජීවිතේ ආරක්ෂා වුණේ මෙලි ගිහිල්ලා තාත්තාට අගවපු නිසා ඉතින් මේ දෙන්නාගේ යාළුකම හැමදාම තිබ්බා.

මාධවී ආය අම්මා කියන දේ අහනවා ඔයාලත් වැඩිහිටියන් කියන දේ අහන්න.....!

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් *හේමමාලා උපහාර* ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)